
# හරි අපූරු විස්සයි විස්ස




ඔවිනි සේනාශ්‍රී රාජපක්ෂ

# හරි අපූරු විස්සයි විස්ස

© ඔවිනි සේනාශ්‍රි රාජපක්ෂ

ISBN 978-624-97000-1-7

දෙවන මුද්‍රණය

2025 පෙබරවාරි 8

කතා

ඔවිනි සේනාශ්‍රි රාජපක්ෂ

පිටු චිත්‍ර නිර්මාණය

ඔවිනි සේනාශ්‍රි රාජපක්ෂ

ප්‍රකාශකයෝ

ආර්. පි. ජයතිස්ස

76/5, නුවර පාර, කෙන්ගල්ල.

මුද්‍රණය

advertize.lk

**පිදුම**

**මගේ අධ්‍යාපන ජීවිතය**

**සාර්ථක කර ගැනීමට හා**

**මාගේ ඥාන ශක්තිය**

**පෝෂණය කිරීමට**

**දිරිය දෙන**

**මගේ ආදරණීය මැණියන්ට**

**පියාණන්ට හා**

**මගේ ආදරණීය ගුරු**

**මැණිවරුන්ට,පියවරුන්ට**

**සෙනෙහසින් මේ**

**පොත් පිංච පුදකරමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කෙරනි. හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අපි හැමෝම 3-C පන්තියට ආවා. 3-C පන්තිය අපිරිසිදුයි. අපි හැමෝම නිකන් හිටියා. අලුත් මැඩම් ආවා. මැඩම් පන්තිය වටපිට බැලුවා. ඊට පස්සේ අපිට කිව්වා, අපි ඉඳන් හිටපු පුටුව, ඩෙස්ක් එක ලේන්සුවකින් පිහදාන්න කියලා. අපි හැමෝම ඩෙස්ක් එකයි, පුටුවයි පිස දැම්මා.මැඩම් ටික වේලාවක් අපිත් එක්ක කතා කළා. “මෙහෙම කරන්න බැහැනේ . අපි දෙමව්පියන්ට එන්න කියලා පන්තිය පිළිවෙළට පිරිසිදු කරන්න ඕන” මැඩම් කිව්වා .ඉතින් ඊළඟ දවසේ දෙමව්පියෝ හැමෝම ඇවිදින් අපේ පන්තිය හුඟාක් ලස්සන කළා.ඒ පිරිසිදු පන්තියට අපි හුඟාක් ආසා වුණා.



අපි හැමෝම 7.30 ට කලින් පාසලට එනවා. සින්දු කියනවා, නිර්මාණ කරනවා.අපට හරිම සතුටුයි. ඔහොම ටික දවසක් ගියා.පාසල් ක්‍රීඩා තරග තිබුණා. අපේ මැඩම් අපි වෙනුවෙන් කොච්චර මහන්සි වුණාද කියනවනම් අපිව දිනනකන්ම අපි ළඟට වෙලා හිටියා.(තරගවලින් පළමු ස්ථානය ලබන්නේ 3-c පන්තිය කියලා නිවේදනය කරද්දී අපි උඩ පැනලා අත්පුඩි ගැහුවේ හුඟාක් සතුටින්. මැඩම්ගේ ඇස්වලත් සතුටු කඳුළු අපි දැක්කා)




දිනය 2020.03.12මම ගෙදර අවා. රෑ වුණා. ප්‍රවෘත්ති බැලුවා.ප්‍රවෘත්ති වලට කිවුවා චීනයේ වූහාන් කියන ප්‍රදේශයේ කොරෝනා කියන රෝගය පැතිරිලා කියලා. ගොඩාක් අයට මේ රෝගය වැළදිලා. සමහර අය මිය ගිහින් කියලා. ඒත් අපි ගණන් ගත්තේ නැහැ. ඊට පස්සේ තමයි අපි දැන ගත්තේ ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, ජපානය, ඉතාලිය වැනි දියුණු රටවල්වල පවා ශීඝ්‍රයෙන් මෙම රෝගය පැතිරිලා කියලා.ගොඩාක් අය මිය ගිහින්.




ඒ වෙනකොට අපේ රටේත් කොරෝනා රෝගය පැතිරිලා. ඒත් අපේ රටේ එක් කෙනෙක්වත් මිය ගිහින් නෑ ඒ වෙන කොට. කොරෝනා රෝගය භයානක වෛරස් රෝගයක් නිසා ලංකාවේ සියලුම පාසල් වලට මාර්තු 13 වන දින නිවාඩුව ලැබුණා .



ඊට පස්සේ දෙමවුපියන්ට එන්න කියලා අපේ පොතුයි ගෙදරවැඩයිදුන්නා. වැඩ දීපු ගමන් අපි කලබල වුණා.කලබල වුණ පාරට ඒ වැඩ ටික ඉක්මනින්ම ඉවර කළා. ඉවර කරලා පාසල පටන්ගන්නේකවදා ද?කියලා බලාගෙන හිටියා.



ඊත් පාසල් පටන් ගන්නවාද කියලා පේන තෙක් මානෙක නෑ.අපි හරිම බයෙන් හිටියේ.ඔහොම ටික දවසක් ගියා.ඉස්කෝලේ අලුත්ලොකු මැඩම් අපි පව් කියලා හිතලා මැඩම්ලව අපටපෙන්නන්නඕන නිසාත් අපට අලුත් විදියට උගන්නන්න ඕන කියලා හිතලා online පන්ති පටන් ගන්න වැඩසටහනක් හැදුවා .දර්ශන සර් කියලා ලොකු ඉස්කෝලේ ගුරුතුමෙක් තමයි අපිට Online පාඩම් සඳහා උදව් කළේ.




**එතකන් අපි කවුරුත් දැනගෙන හිටියේ නැහැනේ,online පන්තියට සම්බන්ධ වෙන හැටි. ඒකත් කොහොමහරි දැනගත්තා . ඒ අතරේ මැඩම් කිවුවා ගෙවත්තක් හදන්න කියලා. අපේ පන්තියේ හැමෝම ලස්සන ගෙවතු හැදුවා.මම ගොඩාක් එළවළු,පලතුරු, ඖෂධ පැළ හැදුවා.**




හොඳම ගෙවත්තත් තේරුවා.මගේ ගෙවත්ත හොඳම ගෙවත්තට තේරුණා.මට හරිම සතුටුයි.ඔහොම ටික දවසක් ගියා.සිංහල,දෙමළ අලුත් අවුරුද්දත් ආවා.අනේ අපොයි අපිට ඉතින් කවදාවත් නැතිව අලුත් අවුරුද්ද සමරන්න වුණේ ගෙදරදීමයිනේ...




ඒත් අපේ අම්මා නම් අලුත් අවුරුද්දට රසට කැවිලි ගොඩාක් හැදුවා..අපිට නෑ ගම් යන්නත් බැහැ.ඒ ඇයි කියලා දන්නවද? එක එක තැන්වලට ඇඳිරි නීතිත් දාලා.අපිට අවුරුදු චාරිත්‍ර ගොඩාක් කරන්න බැරි වුණා.



කාලය ගත වුණා.වෙසක් කාලය ළඟ නිසා මැඩම් අපට කිවුවා වෙසක් කූඩු හදන්න,තරගයක් තියෙනවා කියලා...වෙනදාට අපි දන්සල්වලට,පන්සල්වලට යනවා.ඒත් ඒවා කිසිම දෙයක් කරන්න බැරි වුණා.කොරෝනා නිසා එක එක නීති රීති දැම්මා.ඒ මොනවාද කියලා දන්නවාද යාළුවේ...?



මුඛ ආවරණ පළඳින්න ඕන ,මීටරයක පරතරය තියාගන්න ඕන,සබන් ගාලා නිතරම දෑත් සෝදන්න ඕන .



ඔන්න ඔය අතරේ මගේ ගෙවත්තට ඌරෝ ඇවිත් පැළ ඔක්කොම ගලවලා දාලා.මගේ අම්මා මාව පාන්දර 6.00 ට නැගිට්ටලා මෙහෙම කිව්වා. "දුව ඔයාගේ ගෙවත්තේ පැළ ඌරෝ කාලා"අයියෝ...මම හොඳටෝම ඇඬුවා.ඌරෝ විනාශ කරපු ගෙවත්තේ වීඩියෝවක් මැඩම්ට යැවුවා.ඒක මැඩම් ලොකු මැඩම්ටත් පෙන්නලා.මැඩම්ලා ගොඩාක් දුක්වුණා.මට උපදෙස් එක්ක ගෙවත්ත බේරා ගන්න විදිහත් කියලා දුන්නා.





ඔය අතරේ උදේ 10.00 ට විතර පියුම් මාමා අපේ ගෙදරට පාර්සලයක් දුන්නා.බලනකොට ඒක මගේ නමට තිබුණේ .මම ඒකකඩලා බලද්දී, මට තෑග්ගක්....!එතකොටම අම්මාගේ phone එකට message එකක් ආවා.


මම වෙසක් කූඩු තරගයෙන් ප්‍රථමයා වෙලා කියලා.මට ගොඩාක් සතුටුයි.උදේ තිබුණ දුක නැති වුණා.ඔහොම ටික දවසක් ගියාට පස්සේ......උදේ,දවල්,රෑ අපිට online පන්ති තිබුණා .අපි මැඩම් එක්ක අපූරු අපූරු වැඩ ගොඩාක් කළා.




මොනවද දන්නවද අපූරු වැඩ?අපි ගණිතය,සිංහල,බුද්ධ ධර්මය,පරිසරය වගේ විෂයන් හරි සතුටින් ඉගෙන ගත්තා. දැන් අපූරු වැඩ මොනවද කියලා කියන්නම්කෝ ...Online සාහිත්‍ය සමිතිය කළා.බුද්ධ ධර්මය පාඩමක් තිබුණා, “පොත් පෙරහැර” කියලා.අපි ගෙදර ඉඳලා පවුලේ අයත් එක්ක පොත් පෙරහැරක් පැවැත්තුවා.










මම සාහිත්‍ය සමිතියේ විරිඳුවකටත් ඉදිරිපත් වුණා.onlineකොකිඩාමා පැළයක් සිටුවීම,online ෆ්රූට් සැලඩ් ,අපේම ගෙවත්තෙන් නෙලාගත් එළවළු පළතුරු වලින් සමබල ආහාර වේලක්,රාත්‍රී ආහාරයට සුප් එකයි සැන්ඩ්විච් එකකුත් අපිම හැදුවා.ආ..ඇයි අපූරු නිර්මාණ ගොඩාක් කළා .online හරහා මින්නේරි වැව,මුහුදු වෙරළ,මරදාන බහාලුම් අංගනය,කෘෂිකර්ම පර්යේෂණ ආයතනය වැනි ස්ථානද අපට පෙන්නුවා.හැම යාළුවෙකුගේම ගෙදර හරි අපූරු 'Reading Corner' එකක් හැදුවා.කොරෝනා රෝගය ගැන අපට අමතක ම වෙලා පාඩම් වැඩ වලට යොමු වෙන්න online පාඩම් අපට උදව් වුණා.








අපේ online පන්තිය තමයි ෂෝක්ම පන්තිය .මං හිතන්නේ අපි හරිම ආසාවෙන් ඒ දවස්වල ඉගෙන ගත්තේ.ටික දවසක් ගත වුණා.අගෝස්තු මාසේ පෙරහැර බලන්න වුණේත් නෑ.අපි නම් ගෙදර TV එකෙන් බැලුවා.

ඒකත් මට නම් දැනුණේ එතන ඉඳන් බලනවා වගේ තමයි.රෑ මම නිදා ගත්තෙත් 10.30 ට විතර.ටික දවසක් ගියා..කාලයකින් යහළුවන් දැක්කෙත් නැහැ.හරිම දුකෙන් හිටියේ.හැබැයි online පන්තියේදී නම් එයාලාව දැක්කා.මෙන්න ඔය අතරේ ඉස්කෝලේ පටන් ගන්න සුබ ආරංචියක් ආවා.ඒත් ඉස්කෝලේ පටන්ගත්තේ එක එක වයස් සීමාවලටයි.



ඉස්සර වෙලාම ඉස්කෝලේ ගියේ ලොකු අක්කලා අයියලා නිසා අපිට තව තවත් ඉස්කෝලේ යන්න පරක්කු වුණා.ඒත් 5 ශ්‍රේණියේ අක්කලා හැමදාම ඉස්කෝලේ ගියා.අනිත් යාළුවන් ඉස්කෝලේ ගියේ සතියකට එක් වතාවයි දෙකයි.

කොරෝනා වලට දැම්ම අර නීති රීති හොඳට පිළිපදින්නත් ඕන.එහෙම කරපු නිසා තමයි අපේ රටේ කොරෝනා පාලනය කරන්න පුලුවන් වුණේ කියලා, අපේ විදුහල්පතිතුමිය කිව්වා.ටික දවසක් ගියා.ඊට පස්සේ හැමදාම ඉස්කෝලේ යන්න පුලුවන් වුණා.



Online පන්තියේ තේරුණේ නැති වැඩ මැඩම් අපිට කියලා දුන්නා.Online පන්තියේ ගොඩාක් වැඩ කරලා තිබුණ නිසා අපිට දෙවැනි වාරේ පොඩ්ඩයි වැඩ ඉතිරිවෙලා තිබුණේ.



ඔහොම ටික දවසක් ගියාට පස්සේ අපේ පන්තියේ ළමයි ටිකදෙනෙකුගේ උපන් දිනයකට Book tree එකක් පන්තියට ගෙනාවා.අපිට හිතා ගන්න බැරි වුණා.එතකොටම මැඩම් මෙහෙම කිවුවා.''ඔයාල මේ Book tree එකට පොත් ගේන්න.ගොඩක්ම පොත් ගේන දුවව පුස්තකාලාධිපතිනිය විදියට පත් කරනවා'' හැමෝම පොත් ගෙනාවා.පුස්තකාලාධිපතිනියත් තේරුණා.ඊට පස්සේ සිඟිති පොළක් තිබුණා.අපිට සිඟිති පොළට ගේන්න කිව්වේ, ගෙවත්තෙන් නෙළා ගත්තු එළවළු,පලතුරු.



මේ තුළින් අපිට මුදල් පාඩමේ අත්දැකීම් ලැබුණා.ටික දවසක් ගියා.ලෝක ළමා දිනය ආවා.ඒ දවසේ අපේ Book tree එක Open කළා.අපේ විදුහල්පතිතුමියත් අපේ පන්තියට ඇවිත් පුස්තකාලය විවෘතකරලා අපේ උත්සාහය හුඟාක් අගය කළා.අපි ගොඩාක් සතුටු වුණා.ගොඩාක් විනෝද වුණා.අපිම පත්තර වලින් ඇඳුමක් හදලා ඇඳගෙන නැටුවා.සින්දු කිවුවා.ඇතිවෙනකම් නැටුවා.රස රස කෑම කෑවා .මැඩම් අපිට තෑගිත් දුන්නා.පන්තිය ලස්සනට සරසලා තිබුණා.මේක තමයි අපට සතුටුම ළමා දිනය.“අපේ මැඩම්ට හුඟාක් ස්තූතියි ,හුඟාක් සතුටුවෙන දවසක් අපට දුන්නාට ” අපි ඔක්කොම එක හඬින් කිවුවා.




ගුරු දිනයත් ළඟා වුණා.එතකොටම ප්‍රවෘත්තිවලට කිවුවා, “හෙට දින සිට සියලුම පාසල් දෙවන වාර නිවාඩුව ක්‍රියාත්මක වෙනවා.”කියලා.අපි හොඳටම බය වුණා.මොකද කියලා බලනකොට කොරෝනා දෙවන රැල්ලක් ඇවිත් ආයෙමත් අනේ අපි ගෙදරට කොටු වුණා.



පළවෙනි රැල්ල වගේ නෙවෙි.කොරෝනා දෙවැනි රැල්ල.මුළු ලෝකෙම මිනිසුන් ලක්ෂ ගණනින් මිය යනවා.අපේ රටේත් නොවැම්බර් මාසය වෙනකොට **31000** ක් පමණ රෝගීන් වාර්තා වුණු අතර **146** දෙනෙක් මිය ගොස් තිබේ.

මේ අතර අපූරු වැඩක් වුණා.දිගින් දිගටම භූකම්පන **9**ක් දිගන ප්‍රදේශයෙන් වාර්තා වුණා.අපි දිගන ප්‍රදේශයේ සිටින නිසා අපි ඒ අත්දැකීමත් ලැබුවා.අපි ගොඩාක් බයෙන් තමයි ඉන්නේ...



එදා දෙසැම්බර් දෙවැනිදා.....ලංකාවේ උතුරු ප්‍රදේශයට "බුරවී" සුළි කුණාටුව ඇතුළු වුණා.නමුත් අපේ වාසනාවකට එයින් සිදුවූ හානි අවම කර ගැනීමට හැකි වුණා.මොකද දන්නවද?

ආපදා කළමනාකරණ ආයතනයෙන් කල් ඇතිව ඒ බව අපට දැනුම් දී තිබූ බැවිනි.



කොහෙන් කොහොම වුනත් මට වෙලාවකට හිතෙනවා මිනිස්සු පරිසරයට,සොබාදහමට කරන විනාසය නිසාද අපිට මෙහෙම වෙන්නේ කියලත්.....අලුත් අවුරුද්දක් අපේ ඉස්සරහට එද්දී අපිට පුළුවන්නම් ඉස්සරට වඩා පරිසරයට ආදරය කරන්න,පරිසරයත් වෙනදා වගේ අපිව ආදරයෙන් බලාගනීවි..



**දුක හිතෙන 2020 කොරෝනා නිවාඩු කාලයේදී සතුටු හිතෙන දේවල් අපට දෙන්න අපේ සමන්මලී මැඩම් හුඟාක් උනන්දු වුණ නිසාම, ඉස්කෝලේ ගියාටත් වඩා දේවල් ඉගෙනගන්න අපටOnline පන්තියේ අත්දැකීම් ලැබුණා.ඒ නිසාම, මේ අවුරුද්ද පුංචි අපට නම් හරි අපුරු 2020 කියලා කියන්න පුලුවන්.**

**යාළුවනේ, ඔයලාටත් 2020 අපූරුයි ද ?**



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-97000-1-7